# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

කොමිෂන් සභා චක්‍රලේඛ අංක: 19/2016

අංක 20, වෝඩ් පෙදෙස
කොළඹ 07

2016 දෙසැම්බර් මස 16වන දින

විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්
මණ්ඩපාධිපතිවරුන්
ආයතන අධ්‍යක්ෂවරුන්

<u>ආචාර්යවරුන් සහ නිලධාරීන් සඳහා සප්ත වාර්ෂික නිවාඩු</u>

ආචාර්යවරුන් සහ නිලධාරීන් සඳහා සප්ත වාර්ෂික නිවාඩු සම්බන්ධයෙන් වන 1989/10/25 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 408හි 5(ආ) වගන්තිය සහ 2010/11/15 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 938 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

2. 2016 අංක 17 දරන විශ්වවිද්‍යාල ( සංශෝධිත) පනතෙහි විධිවිධාන සැලකිල්ලට ගෙන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 938 හි විධිවිධාන පහත පරිදි සංශෝධනය කිරීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 2016/11/17 දින පැවැති සිය 953වන සභා වාරයේ දී තීරණය කරන ලදී;

"ආචාර්යවරුන් 64වන උපන් දිනයට ප්‍රථමයෙන් සප්ත වාර්ෂික නිවාඩු අවසන් කළ යුතුය.

නිලධාරීන් සම්බන්ධයෙන් පහත කොන්දේසි අදාළ වනු ඇත;

(i) නිලධාරියෙකු වයස අවුරුදු 55 සම්පූර්ණ වීම මත සේවයෙන් විශ්‍රාම ගැනීමට අපේක්ෂා කරන්නේ නම් ඔහු /ඇය 54වන උපන් දිනට පෙර සප්ත වාර්ෂික නිවාඩු අවසන් කළ යුතුය.

(ii) නිලධාරියෙකු වයස අවුරුදු 60 සම්පූර්ණ වීම මත සේවයෙන් විශ්‍රාම ගැනීමට අපේක්ෂා කරන්නේ නම් ඔහු /ඇය 59වන උපන් දිනට පෙර සප්ත වාර්ෂික නිවාඩු අවසන් කර නැවත රාජකාරියට වාර්තා කළ යුතුය.

(iii) නිලධාරියෙකු වයස අවුරුදු 56-59 අතර සේවයෙන් විශ්‍රාම ගැනීමට අපේක්ෂා කරන්නේ නම් ඔහු /ඇය, ඔහුගේ /ඇයගේ පූර්ව, එනම් විශ්‍රාම ගන්වන දිනට වසරකට පෙර එළැඹෙන උපන් දිනට පෙර, සප්ත වාර්ෂික නිවාඩු අවසන් කර නැවත රාජකාරියට වාර්තා කළ යුතුය. "

3. කොමිෂන් සභා චක්‍රලේඛ අංක 408හි අනෙකුත් ප්‍රතිපාදන සහ මේ සම්බන්ධයෙන් පසුව සිදු කරන ලද සංශෝධන නොවෙනස්ව පවතිනු ඇත.

4. 2010.11.15 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 938 මෙයින් අවලංගු කෙරේ.

5. කරුණාකර ඒ අනුව කටයුතු කරන්න

අ/කළේ: මහාචාර්ය මොහාන් ද සිල්වා

සභාපති

පිටපත්:
1. ලේකම් / උසස් අධ්‍යාපන සහ මහාමාර්ග අමාත්‍යාංශය
2. සභාපති කාර්යාලය / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
3. උප සභාපති / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
4. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයන්
5. ලේකම් / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
6. පීඨාධිපතිවරුන්
7. විශ්වවිද්‍යාල ලේඛකාධිකාරිවරුන්

8. ගණකාධිකාරී / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
9. විශ්වවිද්‍යාල මූල්‍යාධිකාරීවරුන්
10. උසස් අධ්‍යාපන ආයතන/ ආයතනවල පුස්තකාලයාධිපතිවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරුන් / සහකාර පුස්තකාලයාධිපතිවරුන්
11. මණ්ඩප/ ආයතනවල නියෝජ්‍ය ලේඛකාධිකාරිවරුන් / ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරිවරුන් / සහකාර ලේඛකාධිකාරිවරුන්
12. මණ්ඩප/ ආයතනවල නියෝජ්‍ය මූල්‍යාධිකාරීවරුන් / ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරීවරුන් / සහකාර මූල්‍යාධිකාරීවරුන්
13. අභ්‍යන්තර විගණක / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
14. විශ්වවිද්‍යාලවල රජයේ විගණක අධිකාරීවරුන්
15. උසස් අධ්‍යාපන ආයතනවල ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකවරුන්
16. වෘත්තීය සමිති ලේකම්වරුන්
17. විගණකාධිපති

ලිපි ගොනු අංකය : යූජීසී/එච්ආර්/6/4/3